ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No .

දිනය / திகதி / Date. 2024/08/21

පැමිණිලිකරු - බිම්ෂානි ජාසිංහආරච්චි මිය,
අංක - 723/95,
04 වන පටුමග,
ලෙක් ටෙරස්, අතුරුගිරිය.

වගඋත්තරකරුවන් - 01. නියෝජ්‍ය පොලිස්පති,
මානව සම්පත් (දිසාව භාර)
පොලිස් මූලස්ථානය, කොළඹ 01.

02. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති,
(පරිපාලන)
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

03. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

පැමිණිලි අංක - එච්.ආර්.සි/2679/24

පැමිණිල්ලේ කරුණු දැක්වීම :-

ජාතික පොලිස් කොමිෂන් සභා ලේකම්ගේ 2020.10.09 දිනැති නියෝගය පරිදි 2020.10.08 දින සිට තමා ශ්‍රී ලංකා පොලිසියේ සුභ සාධක දිසාව භාර නියෝජ්‍ය පොලිස්පතිනිය ලෙස රාජකාරි ඉටු කිරිම සඳහා පත්කල බවත් එම පත්කිරිම සමග ශ්‍රී ලංකා ඉතිහාසයේ පළමු නියෝජ්‍ය පොලිසිපතිනිය ලෙස වාර්තා අතරට තමා එක් වු බවත්,

පසුව 2021.06.10 දිනැති අනුමැතිය ප්‍රකාරව බස්නාහිර පළාත් ප්‍රජා පොලිස්, පරිසර ආරක්ෂක හා මහජන සාමය කළමණාකරණ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරීමට පත් කළ බවත්,

ඉන් අනතුරුව අංක 14/2022 සහ 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛනය සහ 14/2022 (I) සහ 2022.09.06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛනය අනුව විධිමත් අනුමැතිය ලබාගෙන තමා ඉරාක රාජ්‍යයේ එක්සත් ජාතින්ගේ සහයක මෙහෙයුම් සඳහා 2023.06.15 දින පිටත්ව ගිය බවත් පසුව ගිවිසුම් ගත අවුරුද්දක කාලය එනම්, 2024.06.14 දින අවසන් වීමෙන් පසු 2024.06.15 දින නැවත දිවයිනට පැමිණ 2024.06.17දිනැතිව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන මගින් පොලිස්පති වෙත රාජකාරි වාර්තා කළ බවත්,

දිවයිනට පැමිණි පසු නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි කරගෙන යාමට නොහැකි ලෙස බාධා පැමිණ වූ බවත් තමා 2024.06.18 දින පොලිස්පති හමුවූ අවස්ථාවේ ශ්‍රී ලංකා පොලිස් මානව සම්පත් කළමණාකරණ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති දන්වා සිටියේ තමාගෙන් එම තනතුර ඉවත් කර වෙනත් කෙනෙකු පත් කර ඇති බවත්

- ඒ අනුව තමා රාජකාරියට වාර්තා කළද මේ දක්වා තමාට නිශ්චිත රාජකාරියක් හෝ වගකීම් පැවරීමක් තමා වෙත සිදුකර නොමැති බවත්

- නිල රාජකාරි ස්ථානයක් ලබා නොදීම, (කාර්යාල මේසයක් පුටුවක්, නිශ්චිත ස්ථානයක් ) තුළ නියෝජ්‍ය පොලිස්පතිවරියක ලෙස රාජකාරි අධීක්ෂණයක් සිදුකළ තමා දැඩි අපහසුතාවයකට පත්වීමත්

- රාජකාරියට වාර්තා කිරීමෙන් පසු නිල වශයෙන් වාහනයක් හෝ නිල රියදුරෙකු අනුයුක්ත නොකිරීම හේතුවෙන් දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරියක ලෙස කටයුතු කළ තමා ඌන සැලකිල්ලකට ලක් වන බවත්

- වැඩ බලන නියෝජ්‍ය පොලිස්පතිවරියක ලෙස තමා විසින් රේඛීය ක්‍රමවේදය තුළ සිදුකරනු ලබන කිසිදු ඉල්ලීමකට ප්‍රතිචාර නොදක්වා සාධනීය පිළිතුරු ලබා නොදීමත්,

- තමා නැවත ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරි වාර්තා කිරිම සම්බන්ධව අභ්‍යන්තර නිවේදන නිකුත් නොකර සිටීම තුළත් අගතියට පත් වූ බවත්ය.

ඒ අනුව ඉහත කරුනු අනුව තමා පහත් සැලකිල්ලකට ලක් කිරිමත්, නිතිය ඉදිරියේ අසමානතාවයට ලක්කරන බවත් වැඩිදුරටත් දක්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-

- ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය පරිදි 2020.10.09 දින ලිපිවලට අදාලව කාන්තා ජොෂ්ඨ පොලිස් අධිකාරි බිම්ශානි ජාසිංහආරච්චි මහත්මිය පොලිස් සුභසාධන දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරිම සඳහා පත් කළ බවත්,

- රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලිපිවලට අනුව 2022.06.11 දින සිට 2023.06.10 දින දක්වා හෝ පුරප්පාඩු තනතුරේ ස්ථිර පත්කිරිමක් සිදුකරන තෙක් යන දින දෙකෙන් පළමුව එලැඹෙන දිනය දක්වා පවත්නා රාජකාරි අවශ්‍යතාවය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටියක රිති සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 118 වගන්ති ප්‍රකාරව බස්නාහිර පළාත් ප්‍රජා පොලිස් පරිසර ආරක්ෂක හා මහජන සාමය කළමණාකරණ දිසාව භාරව කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරිමට පත් කළ බවත්,

- මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත මෙම නිලධාරිනිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව 2023.07.01 දින සිට 2024.06.30 දක්වා වසරක වැටුප් රහිත විදේශ නිවාඩු ලබා විදේශ ගත වූ බවත්, පසුව 2024.06.17 දිනැතිව නිලධාරිනිය පොලිස් මූලස්ථානයේ රාජකාරි වාර්තා කර ඇති බව වැඩිදුරටත් දක්වා ඇත.

- මෙම නිලධාරිනිය විදේශගත වීමෙන් ඇතිවූ පුරප්පාඩුව සඳහා ශ්‍රී ලංකා පොලිස් ස්ථානයේ පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා කාන්තා ජොෂ්ඨ පොලිස් අධිකාරි ලේඛනයේ ඉහලින්ම ස්ථානගතව සිටි රාජ්‍ය බුද්ධි සේවයට අනුයුක්තව රාජකාරි කරන ලද ටී.පී.ඩී.ඩබ්.ජයවර්ධන මහත්මිය පත් කිරිමට කරන ලද නිර්දේශය අනුව 2023.10.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරිමට ටී.පී.ඩී.ඩබ්.ජයවර්ධන ජාතික පොලිස් කොමිසම විසින් පත් කිරීම් කළ බවත්, ඒ අනුව මේ වන විට කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ පුරප්පාඩු 04 සම්පූර්ණ වි ඇති බවත් දක්වා ඇත.

- කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ අනුමත තනතුරු 04 සඳහා රාජකාරි ඉටු කිරීමට මේ වන විට කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි 04 දෙනා පත් කර ඇති බවත්, මින් පැමිණිලිකාරිය කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරේ ජ්‍යෙෂ්ඨතාවය අනුව ඉහලින්ම ස්ථානගතව සිටි බැවින් විදේශ නිවාඩු ලබා ගැනිමට පෙර කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරිම සඳහා පත් කරසිට ඇති බවත්ය.

- මෙම නිලධාරිනිය විදේශගත නිවාඩු අවසන් කර පැමිණ පොලිස් මුලස්ථානයේ රාජකාරි වාර්තා කිරීමෙන් පසුව නිලධාරිනිය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර විමසා පත්විම් බලධරයා වන ජාතික පොලිස් කොමිෂන් සභාවේ උපදෙස් විමසා පොලිස්පති විසින් 2024.06.20 දිනැතිව ලිපියක් යොමු කළද මෙතෙක් උපදෙස් ලැබී නොමැති බවත්,

- මෙම නිලධාරිනිය පැමිණිලි කරන කරුණු පිළිබඳව මුලස්ථාන පරිපාලන අධ්‍යක්ෂ විසින් දන්වා ඇත්තේ මෙම නිලධාරිනිය පොලිස් මුලස්ථානයේ රාජකාරි වාර්තා කළ බව හෝ පොලිස් මුලස්ථානයේ කාර්යාලයක් වෙන්කර දෙන ලෙසට මුලස්ථාන පරිපාලන අධ්‍යක්ෂ වෙත ඉල්ලිමක් සිදුකර නොමැති බවයි.

- තවද නිලධාරිනිය සඳහා ස්ථිර රියදුරෙකු මානව සම්පත් කළමණාකරන කොට්ඨාශය මගින් ලබාදෙනතුරු නිලධාරිනියගේ හෝ ලිඛිත ඉල්ලීමට අනුව පොලිස් මුලස්ථානයේ ප්‍රවාහන සංචිතයට අනුයුක්ත රියදුරෙකු හා නිලධාරිනිය හා ඉන්ධන ඇනවුම් පත 2024.07.05 දින සිට නිකුත් කර ඇති බවත් දක්වා ඇත.

- ඉහත කරුණු අනුව පැමිණිලිකාරියගේ රාජකාරි කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් ලබාදිමට කටයුතු කර ඇති බවත් පත්විම් පිළිබඳව පත්විම් බලධාරියා වෙත යොමුකර ඇති බවත් වැඩිදුරටත් දක්වා ඇත.

<u>විමර්ශනය :-</u>

පැමිණිලිකාරිය මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලි කරමින් මූලිකව දක්වා සිටිනුයේ ශ්‍රී ලංකා පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනියක ලෙස තමාට අවමන් සහගත ඌන සැලකිමකට ලක් කළ බවත් නීතියේ රැකවරණය සර්ව සාධාරණව තමාට නොලැබුනු බවත්ය.

මෙහිදි පැමිණිලිකාරිය තමාට අවමන් සහගත සැලකීමකට/ඌන සැලකීමකට ලක්කළ බවට දක්වන කරුණු කෙරේ ප්‍රථමයෙන් අවධානය යොමු කිරිමේදි පැමිණිලිකාරිය විදේශගත සේවය අවසන් කර 2024.06.17 දින නිල වශයෙන් රාජකාරි වාර්තා කළද දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරියක ලෙස කටයුතු කළ තමාට පොලිස් මූලස්ථානය තුළදි කාර්යාල මේසයක්, පුටුවක් හෝ නිශ්චිත ස්ථානයක් ලබා නොදුන් බවත් ඒ හේතුවෙන් මේ දක්වා තමා ආයතනයේ එක් එක් ස්ථානයන්හි කාලය ගත කිරීමට සිදුවී ඇති බවත් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකාර පාර්ශවය කොමිෂන් සභාවේ දක්වනුයේ මෙම පැමිණිලිකාරිය සම්බන්ධයෙන් ඇයගේ තනතුරු පිළිබඳව ගැටලු සහගත තත්ත්වයක් තිබීම මත හා මූලස්ථාන පරිපාලන අධ්‍යක්ෂ වෙතින් රාජකාරි වාර්තා කල බවට හෝ පොලිස් මූලස්ථානයේ කාර්යාලක් වෙන්කර දෙන ලෙසට ඉල්ලීමක් නොකළ බැවින් ඒ සඳහා කටයුතු නොකළ බවයි.

මානව හිමිකම් කොමිෂන් සභාවේ 2024.07.17 දින පැවැති පරීක්ෂණයේදි එලෙස රාජකාරි ස්ථානයක් හෝ ඉදගැනිමට පුටුවක් ලබාදි නොමැති බවට වගඋත්තරකාර පාර්ශවය නියෝජනය කළ නියෝජිතයන් පිළිගෙන ඇත. එදින පරීක්ෂණයේදි පැමිණිලිකාරිය සම්බන්ධව රාජකාරියට වාර්තා කර ඉදගැනිමට පුටුවක් හා මේසයක් ස්ථානයක් වෙන්කර දිමට දැනුම්දුන්නද 2024.07.31 දිනැති පරීක්ෂණ දිනය දක්වා ඒ සඳහා පියවර ගෙන නොමැති බවට කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ. 2024.07.31 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභා පරීක්ෂණයේදි පැමිණිලිකාරියට ඉදගැනීමට ස්ථානයක් ලබාදිමට කොමිෂන් සභාව සිදුකළ නියමය අනුව 2024.08.01 දින පැමිණිලිකාරිය වෙත තාවකාලිකව කාර්යාල කාමරයක් ලබාදුන් බවත් එහි කාර්යාල මේසයක් විධායක නිලධාරින් සඳහා වන පුටුවක් හා අමුත්තන් සඳහා වන පටු දෙකක් සමග වර්ග අඩි 135 ක කාමරයක් බවත් කාර්යාල උපකරණ කිසිවක් ලබා දි නොමැති බවත් පැමිණිලිකාරිය ලිඛිතව දන්වා ඇත.

ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රථම නියෝජ්‍ය පොලිස්පති ලෙස රාජකාරි ඉටු කිරිම කළ නිලධාරිනියක සේවයට වාර්තා කර වැඩකිරිමට නිශ්චිත ස්ථානයක් නොලැබ ආයතනය තුළ අසරණව සිටිම මෙන්ම විදේශ නිවාඩුවකින් පසු තනතුර පිලිබඳ ගැටලුකරි තත්ත්වයක් පවතින බව හේතුවෙන් රාජකාරි ස්ථානයක් නිශ්චිතව වාඩිවිමට පුටුවක් හෝ මේසයක් ලබාදිමට නොහැකි වන බවට වගඋත්තරකරුවන් දක්වන කරුණු දැක්වීම පිළිගත නොහැකි වනවා මෙන්ම අනුමත කළ හැකි කාරණයක් නොවන බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

රාජ්‍ය නිලධාරිනියක මෙන්ම රාජකාරි ඉටුකරන නියෝජ්‍ය පොලිස්පතිවරියක ලෙස නිල ඇඳුමෙන් සැරසී මාස එකමාරක කාලයක් තුළ පොලිස් ස්ථානයේ නිශ්චිත ස්ථානයක වාඩිවීමට කටයුතු කිරීමට සලසා නොදීම තුළින් පැමිණිලිකාරිය ඌන සැලකීමකට ලක් කර ඇති බවද මානව හිමිකම් කොමිෂන් සභාවේ පිළිගැනීමයි.

පැමිණිලිකාරිය දක්වන, පැමිණිලිකාරියට නීතියේ රැකවරණය සර්ව සාධාරණව නොලැබීම පිළිබඳ පැමිණිල්ල කෙරේ අවධානය යොමු කිරීමේදී පැමිණිලිකාරිය දක්වා සිටිනුයේ තමාට 2020.10.09 දින සිට නියෝජ්‍ය පොලිස්පති ධුරයේ රාජකාරි ඉටු කිරීමට පත් කළ බවත් විධිමත් අනුමැතිය ලබාගෙන විදේශ රැකියාවට ගොස් නැවත සේවයට වාර්තා කිරීමේදී එම ධුරය අහිමි කර ඇති බවත් තමා නැවත රාජකාරියට පැමිණීමෙන් පසු ඒ පිළිබඳ නිවේදන නිකුත් කිරීම හා තනතුරට අදාළ කිසිවක් දීමනා/වරප්‍රසාද කිසිවක් ලබා නොදුන් බවයි.

ඒ අනුව පැමිණිලිකාරියට හිමි තනතුර ලබා නොදීම පිළිබඳ අවධානය යොමු කිරීමේදී ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2020.10.09 දිනැති ලිපිය මගින් පැමිණිලිකාරියට රාජකාරි ඉටු කිරීම සඳහා නියෝජ්‍ය පොලිස්පති තනතුරට පත් කර ඇති අතර, පොලිස්පති විසින් 2020.10.12 වන දින සුභ සාධක දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ලෙස පැමිණිලිකාරියව නම් කරමින් දුරකථන පණිවිඩය නිකුත් කර ඇති බව නිරීක්ෂණය වේ.

පසුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ PSC/APP/05/03/34/2021 දිනැති ලිපියට අදාළව 2022.06.11 දින සිට 2023.06.10 දින දක්වා හෝ පුරප්පාඩු තනතුරට ස්ථිර පත් කිරීමක් සිදුකරන තෙක් යන දින දෙකෙන් පළමුව එළෙඹෙන දිනය දක්වා පවතින රාජකාරි අවශ්‍යතාවය අනුව පැමිණිලිකාරිය ප්‍රජා පොලිස් පරිසර, ආරක්ෂණ හා මහජන සාමය කළමණාකරන දිසාව භාරව කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කර ඇති බවට නිරීක්ෂණය වේ. එහිදී පැමිණිලිකාරිය ඒ සඳහා 2023.07.01 දින සිට 2024.06.30 වන දින දක්වා වසර 01 ක කාලය සඳහා පැමිණිලිකාරිය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 2(ආ) ප්‍රකාරව ඉරාක රාජ්‍යයේ එක්සත් ජාතීන්ගේ සහායක මෙහෙයුම් රැකියාවක් සඳහා අදාළ බලධාරීන්ගේ අනුමැතිය ඇතිව ගොස් ඇති බව නිරීක්ෂණය වේ. එහිදී පැමිණිලිකාරිය ඒ සඳහා පිටව යාමේදී රාජකාරි ඉටු කරන නියෝජ්‍ය පොලිස්පතිවරියක ලෙස කටයුතු කර ඇති බවද අවධානයට ලක්වේ.

පැමිණිලිකාරිය විදේශ රැකියාවක් සඳහා යොමු වූ පසු කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුර පුරප්පාඩු වූ බවත් ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරි සහ පරිපාලන කටයුතු පවත්වාගන යාම සඳහාත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ ඉහලින්ම ස්ථානගතව සිටි ටී.ඩී.ඩී.ඩබ්.ජයවර්ධන මහත්මියව 2023.09.13 දින ලිපිය මගින් නිර්දේශ කර ජාතික පොලිස් කොමිසමට යොමුකර ඇති බවත් ඒ අනුව 2023.10.20 දාතමින් ජාතික පොලිස් කොමිසම අනුමැතිය ලබාදී ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය 2024.06.17 දින විදේශ රැකියාවෙන් අනතුරුව සේවයට වාර්තා කර ඇති නමුත් පැමිණිලිකරිය සේවයට වාර්තා කළ බවට නිවේදන නිකුත් කිරීම මේ දක්වා සිදුකර නොමැති බවට කරුණු නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය නැවත පැමිණීමෙන් අනතුරුව 2024.06.17 දිනැතිව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන මගින් පොලිස්පති වෙත පැමිණිලිකාරිය රාජකාරියට වාර්තා කළ බව ලිඛිතව යවා ඇත. 2024.06.20 දිනැතිව පොලිස් කොමිසම වෙත පොලිස්පතිවරයා විසින් කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි යන විෂය යටතේ මේ වන විට කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරු 04 ම පිරී ඇති බවත් පැමිණිලිකාරිය ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ ඉහලින්ම සිටින බවත් 2024.06.15 දින රාජකාරි ඉටු කරන කාන්තා නියෝජ්‍ය පොලිස්පති ලෙස රාජකාරි වාර්තා කර ඇති බැවින් ඒ පිලිබඳව උපදෙස් පතා ලිපියක් යොමු කර ඇති බවට කරුණු නිරීක්ෂණය වේ.

එම ලිපියට පිළිතුර ලෙස 2024.06.28 දිනැතිව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණ හා නිර්දේශ ලබා දෙන ලෙස ශ්‍රී ලංකා පොලිසියට දන්වා ඇත. නැවත 2024.07.23 දින නිර්දේශ ඉල්ලා ඇති බව නිරීක්ෂණය වේ.

මේ දක්වා ශ්‍රී ලංකා පොලිසිය විසින් පත්වීම් බලධරයා වෙත නිසි නිර්දේශ හා නිරීක්ෂණ යොමු කර නොමැති බවට කොමිෂන් සභාවේ අවධානය ලක්වේ.

මෙහිදී පැමිණිලිකාරිය නැවත රාජකාරියට පැමිණීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසිය නිවේදන නිකුත් නොකිරීමට හේතුව වූයේ පැමිණිලිකාරියගේ තනතුර පිළිබඳ වූ ගැටලුව බව වගඋත්තරකාර පාර්ශවය දක්වා සිටියද පැමිණිලිකාරියගේ තනතුර පිළිබඳ සලකා බැලීමේදී පැමිණිලිකාරිය කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරියට පත් කිරීමට අනුව 2023.06.10 දින දක්වා හෝ පුරප්පාඩු තනතුරට ස්ථිර පත් කිරීමක් සිදුකරන තෙක් යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා පත් කිරීම කර ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය 2023.06.15 දින සිට වැටුප් රහිත එතෙර නිවාඩුව යනතුරු එම පත්වීම වලංගුව පැවැති බවට කරුණු නිරීක්ෂණය වන අතරම එම රාජකාරි ඉටු කිරිමට අදාළ පත්වීම අවලංගු වූ බවට කිසිදු ලේඛනයක් මේ දක්වා පැමිණිලිකාරියට ශ්‍රී ලංකා පොලිසිය විසින් යොමුකර නොමැති බවට කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති අංක : PSC/APP/09/05/2021(1) සහ 2022.10.25 දිනැති ලිපිය ප්‍රකාරව කාන්තා “නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කරන ලද කාල සීමාව දීර්ඝ කිරීම” යන මැයෙන් පහත පරිදි නියෝජ්‍ය පොලිස්පති තනතුරුවල රාජකාරි කිරීම සඳහා පත් කර ඇති බව පෙනී යයි.

| අනු අංක | නිලය සහ නම | රාජකාරි ඉටු කිරීම සඳහා පත් කර ඇති නි.පො.ප දිසාව | නි.පො.ප තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කිරීම දීර්ඝ කරනු ලබන කාලසීමාව |
|---|---|---|---|
| 01. | කා.ජෝ.පො.අ ඒ.පී.එන්.ඩී.සෙනෙවිරත්න මිය | පර්යේෂණ හා තොරතුරු තාක්ෂණ | 2022.10.28 දින සිට 2023.10.27 දින දක්වා වසරකින් හෝ පුරප්පාඩුව සඳහා පූර්ණ කාලීනව නිලධරයෙකු පත් කිරීම සිදුකරන තෙක් යන දින දෙකෙන් පළමු එළඹෙන දින දක්වා |
| 02. | කා.ජෝ.පො.අ එස්.ඒ.ආර්.ජයසුන්දර මිය | ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන | |
| 03. | කා.ජෝ.පො.අ ඩබ්.ජේ.පද්මිනි මිය | සුභසාධන | |
| 04. | කා.ජෝ.පො.අ බී.ජාසිංහආරච්චි මිය | ප්‍රජා පොලිස්, පරිසර ආරක්ෂණ හා මහජන සාමය කළමණාකරන | 2022.06.11 දින සිට 2023.06.10 දින දක්වා වසරකින් හෝ පුරප්පාඩුව සඳහා පූර්ණ කාලීනව නිලධරයෙකු පත් කිරීම සිදුකරන තෙක් යන දින දෙකෙන් පළමු එළඹෙන දින දක්වා |

පැමිණිලිකාර බිම්ෂානි ජාසිංහආරච්චි යන නිලධාරිනිය විදේශගත වීමෙන් අනතුරුව අනෙක් කාන්තා නියෝජ්‍ය පොලිස්පතිවරියන් තිදෙනා වන කා.ජෝ.පො.අ ඒ.පී.එන්.ඩී.සෙනෙවිරත්න මිය, කා.ජෝ.පො.අ එස්.ඒ.ආර්.ජයසුන්දර මිය, සහ කා.ජෝ.පො.අ ඩබ්.ජේ.පද්මිනි මිය යන නිලධාරිනියන්ගේ රාජකාරි කාලසීමාව පහත වගුවේ සඳහන් “නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත්කරන ලද කාලසීමාව දීර්ඝ කිරීම යන” මැයෙන් 2023.12.02 දාතමින් දීර්ඝ කර ඇති බව නිරීක්ෂණය වේ.

| අනු අංක | නිලය සහ නම | රාජකාරි ඉටු කිරීම සඳහා පත් කර ඇති නි.පො.ප දිසාව | නි.පො.ප තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කිරීම දීර්ඝ කරනු ලබන කාලසීමාව |
|---|---|---|---|
| 01. | කා.ජ්‍යො.පො.අ ඒ.පී.එන්.ඩී.සෙනෙවිරත්න මිය | පර්යේෂණ හා තොරතුරු තාක්ෂණ | 2023.10.28 දින සිට 2024.10.27 දින දක්වා වසරකින් හෝ පුරප්පාඩුව සඳහා පූර්ණ කාලීනව නිලධරයෙකු පත් කිරීම සිදුකරන තෙක් යන දින දෙකෙන් පළමු එලඹෙන දින දක්වා |
| 02. | කා.ජ්‍යො.පො.අ එස්.ඒ.ආර්.ජයසුන්දර මිය | ළමා හා කාන්තා අපයෝජන නිවාරණ හා විමර්ශන | |
| 03. | කා.ජ්‍යො.පො.අ ඩබ්.ජේ.පද්මිනි මිය | සුභසාධන | |

එසේම පැමිණිලිකාරිය වෙනුවට පත් කළ බවට දක්වන කාන්තා නියෝජ්‍ය පොලිස්පතිවරිය පත්කළ 2023.10.24 දාතම ලිපිය පිළිබඳව අවධානය යොමු කිරීමේදී පහත නම් සඳහන් " නිලධාරිනිය 2023.10.05 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරීම සඳහා පත් කිරීමට නියෝග කරමි "ලෙස දක්වා ඇත. ඒ අනුව එම ලිපියට අදාළව පත් කරන කාලසීමාව දක්වා නොමැති බව කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ.

තවද පැමිණිලිකාරිය විසින් තමා විදේශීය රැකියාව සඳහා අනුමැතිය ලබාගන්නා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය කෙරේ අවධානය යොමු කිරීමේදී එහි දක්වා ඇත්තේ 04 (අ) කොටසේ නැවත දැනුම් දෙනතුරු වැටුප් රහිත නිවාඩු ලබාගන්නා නිලධාරින්ගේ එසේ ලබාගන්නා වැටුප් රහිත නිවාඩු කාලසීමාව ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය සහ විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා සේවා කාලයක් ලෙස ගණනය කරනු ලැබේ ලෙසයි. ඒ අනුව පැමිණිලිකාරිය විදේශගත වීමට වැටුප් රහිත නිවාඩුව ලබාගත්තද ඇයගේ ජ්‍යෙෂ්ඨත්වය එලෙසම පවතින බවද නිරීක්ෂණය වේ.

තවද වගඋත්තරකාර පාර්ශවය 2024.07.25 දාතම ලිපිය අනුව පැමිණිලිකාරිය කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරේ ජ්‍යෙෂ්ඨත්වය අනුව ඉහලින්ම ස්ථානගතව සිටින බව දක්වා ඇත. එම තනතුර සඳහා ඒ අනුව පැමිණිලිකාරිය හිමිකම් ලබන බව මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ශ්‍රී ලංකා "බස්නාහිර පළාත් ප්‍රජා පොලිස් පරිසර ආරක්ෂන හා මහජන සාමය කළමණාකරන දිසාව භාර නියෝජ්‍ය කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරිම සඳහා පත්කළ පැමිණිලිකාරිය විදේශගතව වි ඇති බවත් එබැවින් ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරි සහ පරිපාලන කටයුතු පවත්වාගෙන යාම සඳහා කාන්තා නියෝජ්‍ය පොලිස්පති තනතුරේ රාජකාරි ඉටු කිරිමට වෙනත් නිලධාරිනියක් පත් කළ යුතු බවත් දක්වා ශ්‍රී ලංකා පොලිසිය ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති අතර, එමගින් පත්කළ නිලධාරිනිය පැමිණිලිකාරියට වඩා ජොෂ්ඨත්වයෙන් පහල නිලධාරිනියක බව කොමිෂන් සභාවේ අවධානයට ලක්වන අතරම මෙම පැමිණිලිකාරිය විදේශ ගතවූ කාලය තුළ රාජකාරි හා පරිපාලනය පවත්වාගැනිමට අවශ්‍යතාවය මත එම පත් කිරිම සිදුකලානම් ඇය රාජකාරි ඉටු කිරීම සඳහා පත්කළ යුත්තේ බස්නාහිර පළාත් ප්‍රජා පොලිස් පරිසර ආරක්ෂන හා මහජන සාමය කළමණාකරන දිසාවට වුවද එසේ සිදුකර නොමැති බවට කරුණු අනාවරණය වේ.

එසේම පැමිණිලිකාරිය විදේශගතවිමෙන් පසුව බස්නාහිර පළාත් ප්‍රජා පොලිස් පරිසර ආරක්ෂන හා මහජන සාමය කළමණාකරන දිසාවේ රාජකාරි ඉටු කිරිම සඳහා වෙනත් නිලධාරියෙකු පත්කර ඇති අතරම පසුව එම දිසාවද අහෝසි කර ඇති බවද නිරීක්ෂණය වේ.

ඒ අනුව 14/2022 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛනයේ දක්වා ඇති පරිදි ජොෂ්ඨත්වයට හානි නොවන බවට දක්වා ඇති නිත්‍යානුකුල අපේක්ෂාව මත හා .තමාට රාජකාරි ඉටු කිරිම සඳහා ලබාදී ඇති නියෝජ්‍ය පොලිස්පති තනතුරට හානියක් නොමැති බවට නිත්‍යානුකුල අපේක්ෂාවක් පැමිණිලිකාරියට පැවතුනද වගඋත්තරකාර පාර්ශවය එම අපේක්ෂාව සාධාරණ හේතුවෙන් තොරව අහිමි කර ඇත.

ඒ අනුව පැමිණිලිකාරිය සම්බන්ධයෙන් ක්‍රියාත්මක විම අත්තෝමතික ආකාරයෙන් සිදුකළාද යන ගැටලුව මෙහිදී පැන නගී.

ඒ අනුව පැමිණිලිකාරිය නියෝජ්‍ය පොලිස්පති තනතුර සඳහා පත්විම් ලද පළමු ජොෂ්ඨ පොලිස් අධිකාරි වන අතර, ජොෂ්ඨත්වය මත ඇය ඒ සඳහා සුදුසුකම් ලබන බවද නිරීක්ෂණය වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව එනම් සර්ව සාධාරණත්වය වන සංකල්පයෙහි මුල් අරමුණ නම් වෙනස් කළ නොහැකි හා අත්පත් කරගත් ලක්ෂණ මත පදනම්ව හෝ හේතුකොට ගෙන වෙනස් කොට සැලකිම වැලැක්වීමයි. එනම් නීතිය පසිදලිම, රැකවරණය හා නීතිය ක්‍රියාත්මක වීම සර්වසාධාරණ විය යුතු බවයි. වර්තමානයේ සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම නීතියේ පිළිගෙන ඇති අනෙකුත් අසාධාරණකම් වැලැක්වීමට හේතු කර ගැනීමට හැකි නිසාත් වඩාත් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කරන අයිතිවාසිකමක් ලෙස පිළිගෙන ඇත.

තවද විජේරත්න එ ශ්‍රී ලංකා වරාය අධිකාරිය SCFR 256/2017 හිදී කොදාගොඩ විනිසුරුතුමා විසින් SCFR 231/2018 අංක දරණ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව උපුටා දක්වමින් එහි පිටු අංක 17 සහ 08 හි සඳහන් පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවේ අරමුණ වෙනස් කොට සැලකීමක් ලෙස පෙනෙන අසාධාරණකම් වලට පිලියමක් ලබාදීම පමණක් නොවන අතර, නීතියෙන් පිළිගෙන ඇති අනෙකුත් ව්‍යාධි රසකට පිළියමක් සලසාදීම බව විග්‍රහ කර ඇත.

ඒ අනුව මෙහිදී පැමිණිලිකාරිය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති වන නිතියේ රැකවරණය වගඋත්තරකරුවන් විසින් අහිමි කොට ඇති බව නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් පරිදි නිර්දේශ කර සිටී,

01. පැමිණිලිකාරියගේ තනතුර සම්බන්ධයෙන් නිරීක්ෂණ හා නිර්දේශ ඇතුලත් කඩිනම් වාර්තාවක් 2024.09.10 දිනට ප්‍රථම ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත, මානව හිමිකම් කොමිෂන් සභාවටද පිටපතක් සහිතව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන විසින් යොමු කළ යුතුය.

02. පොලිස් කොමිෂන් සභාව විසින් අදාළ වාර්තාව හා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ සලකා සුදුසු පියවර ගත යුතු බවට නිර්දේශ කෙරේ.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

| | | | | |
|---|---|---|---|---|
| පිටපත | - | 01. | අමාත්‍යතුමා,<br>මහජන ආරක්ෂක අමාත්‍යාංශය,<br>බත්තරමුල්ල. | දැ.ගැ.පි |
| | | 02. | ලේකම්,<br>ජාතික පොලිස් කොමිෂන් සභාව,<br>කොළඹ 07. | සුදුසු පියවර ගැනීම සදහා |